2020

වාර්ෂික වාර්තාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

9 වන මහල, "ජනජයසිටි" ගොඩනැගිල්ල, නාවල පාර,
රාජගිරිය.

2020 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතෙහි විධිවිධාන වලට අනුකූලව ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

01. දැක්ම

මහජනයා වෙත සේවය සපයනු ලබන සියලු ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට බලගැන්වූ ආයතනය බවට පත්වීම.

02. මෙහෙවර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමර්ශනය, අධීක්ෂණය, අධ්‍යාපනය සහ උපදේශනය මගින් මහජනතාවගේ ද්වීභාෂාමය අවශ්‍යතා සැපයීම.

03. අරමුණු

කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධාන අනුව ක්‍රියාකිරීම පිළිබඳව විමසිලිමත් වීම හා අධීක්ෂණය කිරීම.

(ආ) (මෙහි මින්මතු ‘‘අදාළ භාෂාව’’ යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාවෙහි සඳහන් භාෂා භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ භාවාර්ථයට හා චේතනාවට අනුකූලව සිදුවන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් කිරීම සහ පියවර ගැනීම.

(ඇ) රාජ්‍ය භාෂා ඇගයීම, දිරිගැන්වීම සහ ඒවායේ තරාතිරම, සමානත්වය සහ භාවිත කිරීමේ අයිතිවාසිකම පිළිගැනීම, පවත්වාගෙන යාම සහ ඉදිරියට ගෙන යාම.

(ඈ) සිය මෙහෙයවීමෙන් සහ ලැබෙන යම් පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් යන දෙයාකාරයෙන්ම විමර්ශන පැවැත්වීම හා මේ පනතේ විධිවිධාන වලින් සලසා ඇති පරිදි ප්‍රතිකර්ම යෙදීම.

04. ප්‍රධාන කාර්යයන්

උක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොමිෂන් සභාව මගින් ප්‍රධාන කාර්යයන් හතරක් ඉටුකරනු ලැබේ.

1. ප්‍රතිපත්තිමය මූලධර්ම සම්පාදනය - උපදේශනය

2. රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන රාජ්‍ය යාන්ත්‍රණය විසින් නිසි පරිදි අනුගමනය කරන්නේද යන්න ගැන - අධීක්ෂණය

3. අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය පිළිබඳව දැනුවත් කිරීම - අධ්‍යාපනය

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි - විමර්ශනය

05. සංවිධාන ව්‍යූහය

(අ) රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පත්කරනු ලබන්නේ ජනපතිවරයා විසිනි. කොමිෂන් සභාව සාමාජිකයන් හයදෙනෙකුගෙන් සමන්විත වේ. එක් සාමාජිකයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නම් කරනු ලබයි. සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ.

2020/01/22 දින පත් කරන ලද කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

1. නීතිඥ ඩී. කලන්සූරිය
2. මහාචාර්ය සඳගෝමි කෝපරහේවා (කොළඹ විශ්ව විද්‍යාලය)
3. මහාචාර්ය රදිරාණි යෝගේන්ද්‍රරාජා (යාපනය විශ්ව විද්‍යාලය)
4. මහාචාර්ය දුෂ්‍යන්ති මෙන්ඩිස් (කොළඹ විශ්ව විද්‍යාලය)
5. ආචාර්ය කවිතා රාජරත්නම් (කැළණිය විශ්ව විද්‍යාලය)
6. වසන්ත ඒකනායක

මෙම කාල සීමාව සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (1) වන පන්තියේ සැනෝජි රුවිනිකා පෙරේරා මහත්මිය නිල බලයෙන් කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් කටයුතු කරන ලදි.

(අ) 2020/12/31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි සංවිධාන ව්‍යුහය



(ආ) කාර්ය මණ්ඩලය

2020.12.31 දින වනවිට කොමිෂන් සභාවේ සේවය කළ කාර්ය මණ්ඩලය

අනු අංකය	නිල නාමය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	සටහන
01.	අධ්‍යක්ෂක	01	-	පුරප්පාඩු 01
02.	සහකාර අධ්‍යක්ෂ	01	01	
03.	භාෂා නිලධාරි	03	01	පුරප්පාඩු 02
04.	පරිපාලන නිලධාරි	01	01	
05.	මුල්‍ය නිලධාරි	01	-	පුරප්පාඩු 01
05.	ප්‍රධාන ලිපිකරු	01	01	
06.	භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරි	10	04	පුරප්පාඩු 06
07.	සංවර්ධන නිලධාරි	04	-	පුරප්පාඩු 04
08.	කළමනාකරණ සහකාර	10	08	පුරප්පාඩු 02
09.	භාෂා පරිවර්තක (දෙමළ/ ඉංග්‍රීසි)	01	-	පුරප්පාඩු 01
10.	භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි)	01	-	පුරප්පාඩු 01
11.	භාෂා පරිවර්තක (සිංහල/ දෙමළ)	01	-	පුරප්පාඩු 01
12.	රියදුරු	03	02	පුරප්පාඩු 01
13.	කාර්යාල කාර්ය සහායක	04	03	පුරප්පාඩු 01
	මුළු සංඛ්‍යාව	**42**	**21**	**පුරප්පාඩු 21**

II කොටස

(06) භාෂා විගණන

භාෂා විගණන කොමිෂන් සභාවේ අධීක්ෂණ කාර්යයට අදාළ වන ක්‍රියාකාරකමකි. මෙහිදී රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කොමිෂන් සභාව සෘජුව පරීක්ෂාවට ලක්කර හඳුනාගනු ලබන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූල නොවන තත්ත්වයන් සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම සහ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම කොමිෂන් සභාව මගින් සිදුකරනු ලබයි.

භාෂා විගණන වලදී කොමිෂන් සභාව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළ දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිතා කරයි. විගණන සඳහා තෝරාගනු ලබන ආයතන වෙත මෙම ප්‍රශ්නාවලිය පළමුව ඉදිරිපත් කරයි. මෙමඟින් අපේක්ෂා කරනුයේ ක්ෂණිකව ලබාගත නොහැකි තොරතුරු සම්බන්ධයෙන් පෙර සූදානමක් ආයතනයේ ඇතිකිරීමයි. එම ප්‍රශ්නාවලිය සමඟ විගණනය සඳහා දින යොදාගැනීම සිදුකරයි.

කොමිෂන් සභාවෙහි භාෂා විගණන කණ්ඩායම පස්දෙනෙකුගෙන් පමණ සමන්විත වෙයි භාෂා නිලධාරි ප්‍රමුඛ භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරීන් තිදෙනෙකු සහ කාර්යාල කාර්ය සහායකයෙකු මෙම කණ්ඩායමට අයත් වේ.

විගණන කණ්ඩායම යොදාගත් දින අනුව අදාළ ආයතනය විගණනය කරනු ලබයි. මෙහිදී ප්‍රශ්නාවලිය මඟින් ඉදිරිපත් කරන ලද තොරතුරුද සැලකිල්ලටගෙන පහත සඳහන් නිර්ණායකයන්ට අනුව විගණනය සිදු කරනු ලබයි.

1. ආයතන පරිශ්‍රයේ මහජන ප්‍රදර්ශනය කරනු ලබන සියලුම පුවරු, (නාම පුවරු, තොරතුරු පුවරු, උපදෙස් පුවරු)
2. මහජන සේවය සඳහා භාවිතාකරනු ලබන සියලුම ලේඛන
3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත්භාවය
4. නිලධාරීන්ගේ සන්නිවේදන හැකියාව
5. සිංහල/ දෙමළ පුහුණු පාඨමාලා පැවැත්වීම
6. නිලධාරින්ගේ භාෂා ප්‍රවීණතාවය
7. වෙබ් අඩවිය
8. පරිවර්තන කටයුතු
9. පිවිසුම් කාර්යාල පසුබිම
10. ආයතනයට අදාළ විශේෂිත කරුණු (උදා-: පොලිස්ථාන - පැමිණිලි සටහන් කිරීම උප්පැන්න/ විවාහ/ මරණ රෙජිස්ට්‍රාර් - සහතිකපත්‍ර රාජ්‍ය භාෂාවලින් ලබාදීම.)

මෙම පරීක්ෂාවේදී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පවතින අනනුකූලතාවයන් සියල්ල හඳුනාගනු ලබයි. එම අනනුකූලතාවයන් නිවැරදි කිරීම සඳහා අදාළ ආයතන ප්‍රධානියා වෙත නිර්දේශ නිකුත් කරනු ලබයි.එම නිර්දේශ මාස 3ක කාලසීමාවක් තුලදී ක්‍රියාත්මක කර කොමිෂන් සභාව වෙත වාර්තා කල යුතුය.මෙම වර්ෂය තුලදී සිදුකල භාෂා විගණන වගුව 1 මගින් දැක්වේ.

භාෂා විගණනය

(2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා)

අනුඅං.	ස්ථානය	දිනය
1	ලංකා විදුලිබල මණ්ඩලය-අනුරාධපුරය	2020.03.04
2	පොලිස් ස්ථානය- අනුරාධපුරය	2020.03.04
3	සමාජ සේවා දෙපාර්තමේන්තුව-අනුරාධපුරය	2020.03.04
4	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව-අනුරාධපුරය	2020.03.05
5	තැපැල් කාර්යාලය -බොරුල්ල	2020.09.23
6	පොලිස් ස්ථානය -ආමර් වීදිය	2020.09.23
7	ප්‍රාදේශිය සභා -වත්තල	2020.09.23
8	තැපැල් කාර්යාලය-කොත්මලේ	2020.09.29
9	පොලිස් ස්ථානය-කොත්මලේ	2020.09.29
10	ප්‍රාදේශීය සභාව - කොත්මලේ	2020.09.30
11	දුම්රිය ස්ථානය-කොත්මලේ	2020.12.15



රූපය 1භාෂා විගණනය. කොත්මලේ පොලිසිය



රූපය 2 භාෂා විගණනය. කොත්මලේ ප්‍රාදේශිය සභාව



රූපය 3: භාෂා විගණනය-කොත්මලේ ප්‍රාදේශීය සභාව

(07) භාෂා කව

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා භාවිතා කිරීම පාසල් දරුවන්ට හුරු කිරීම අනාගතයේදී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ඵලදායීවන ක්‍රියාවකි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සිදුකරන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල් තුළ භාෂා කව පිහිටුවීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කරන ලදි. ED/01/05/01/45 අංක දරන 2015.08.14 එම චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පාසැල් භාෂාකව පිහිටුවීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින් පාසැල් ළමුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරයි. 2020 වර්ෂයේදී සිදුකරන ලද එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් පහත වගුවෙහි පරිදී වේ.

	ස්ථානය	දිනය	සහභාගී වූ පාසැල්ගණන
1	රත්නපුර දිස්ත්‍රික්කය	2020.02.28	53
2	අනුරාධපුර දිස්ත්‍රික්කය	2020.03.05	38
පාසැල් තුළ භාෂා කව පිහිටුවීම් සම්බන්ධව පසුවිපරම් කිරීම			
4	තල්දුව විද්‍යාලය- දෙහිඕවිට	2020.03.10	37
5	දෙහිඕවිට විද්‍යාලය- දෙහිඕවිට	2020.09.20	50





අනුරාධපුර දිස්ත්‍රික්කය



(08) පැමිණිලි විමර්ශනය.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය සඳහා කොමිෂන් සභා පනත මගින් කොමිෂන් සභාව වෙත විශේෂිත බලතල හිමිවී ඇත. එවැනි පැමිණිලි විමර්ශනය කිරීම කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයකි. මෙවැනි පැමිණිලි කොමිෂන් සභාව වෙත පහත ආකාරයෙන් යොමු වේ.

01. ලිපි මගින්
02. කොමිෂන් සභාව වෙත පැමිණීමෙන්
03. මුද්‍රිත මාධ්‍යවල පළවන පැමිණිලි
04. විද්‍යුත් තැපෑල
05. දුරකථන පණිවුඩ
06. අමාත්‍යාංශයේ 1956 ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු වන පැමිණිලි

සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාව වෙත පැමිණිලි 60 ඉදිරිපත් වී ඇත. මෙම පැමිණිලිවලින් 24ක විමර්ශන කටයුතු 2020 වර්ෂයේදී අවසන් කර ඇත. මෙම වර්ෂය තුළදී අවසන් කරන ලද විශේෂිත පැමිණිලි කිහිපයක් පහත වගුවේ දැක්වේ.

වගුව 3

පැමිණිල්ල	ගත් ක්‍රියාමාර්ග
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සඳහා මා සිංහල භාෂාවෙන් අයදුම්පත් ඉදිරිපත් කළත් එම වාර්තාව ලබා දී තිබෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.මෙය රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීමක් බව	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපි යවා ඇත. අදාළ වාර්තාව සිංහල භාෂාවෙන් ලබාදෙන ලෙස නිර්දේශ කිරීම.
තංගල්ල අධිකරණය මගින් එම ආයතනයට අයත් මාර්ගයේ සවිකර ඇති නාමපුවරුවෙහි එම ආයතනයේ නම දෙමළ භාෂාවෙන් සඳහන් කර නොමැති බව	තංගල්ල අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපි යවා ඇත. අදාළ මාර්ගයේ සවිකර ඇති නාම පුවරුව භාෂාත්‍රයෙන් සකස් කරන ලෙස නිර්දේශ කිරීම.
රාජගිරිය ආයුර්වේද රෝහලෙහි ශල්‍ය හා ගුදාශ්‍රිත රෝග දක්වා ඇති නාම පුවරුවෙහි දෙමළ භාෂා අක්ෂර දෝෂ සහිත බව	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් නිවැරදි කර එවන ලද පරිවර්තනය රාජගිරිය ආයුර්වේද රෝහලෙහි අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වායවා ඇති අතර ඒ අනුව අදාළ නාම පුවරුව භාෂාත්‍රයෙන් සකස් කරන ලෙස නිර්දේශ කිරීම.
දෙහිවල සත්වෝද්‍යානයේ සුදු මොනරා නමැති සත්ව කාණ්ඩයට අයත් නාමපුවරුවේ ‘සුදු‘ යන්න දැක්වීමේ දී දෙමළ භාෂා අක්ෂර දෝෂ සහිත බව	දෙහිවල සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ නාම පුවරුවේ දෙමළ භාෂා අක්ෂර දෝෂ නිවැරදි කරන ලෙස නිර්දේශ කිරීම.

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයේ ආධුනිකයින් ඇතුළත් කරගැනීම අදාළ පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පමණක් පවත්වන බව	රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයේ ආධුනිකයින් ඇතුළත් කිරීමට අදාළ පාඨමාලා භාෂාත්‍රෙයන්ම පවත්වන ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරි වෙත නිර්දේශ කිරීම.
කිරිබත්ගොඩ මහජන බැංකුවෙහි නාමපුවරුවෙහි ස්ථාන නාමය සඳහන් කිරීමේ දී ද්‍රවිඩ භාෂාවෙන් අක්ෂරයන්හී දෝෂ සහිත බවත්, දැනුවත් කිරීමේ පුවරු හා තොරතුරු පුවරු සියල්ලෙහි දෙමළ භාෂාව ප්‍රතික්ෂේප කර ඇති බව	අදාළ නාමපුවරුවෙහි ස්ථාන නාමයෙහි දෙමළ භාෂා අක්ෂර දෝෂ නිවැරදි කරන ලෙසත් දැනුවත් කිරීමේ පුවරු සහ තොරතුරු පුවරු සියල්ලෙහි දෙමළ භාෂාව ඇතුළත් කර භාෂාත්‍රයෙන් සකස් කරන ලෙසත් මහජන බැංකුවෙහි ප්‍රධාන කළමනාකරු වෙත නිර්දේශ කිරීම
කඩවත මහජන බැංකුවෙහි නාමපුවරුවෙහි ස්ථාන නාමය සඳහන් කිරීමේ දී දෙමළ භාෂා අක්ෂර දෝෂ සහිත බවත්, දැනුවත් කිරීමේ පුවරු හා තොරතුරු පුවරු සියල්ලෙහි දෙමළ භාෂාව ප්‍රතික්ෂේප කර ඇති බව	අදාළ නාමපුවරුවෙහි ස්ථාන නාමයෙහි දෙමළ භාෂා අක්ෂර දෝෂ නිවැරදි කරන ලෙසත් දැනුවත් කිරීමේ පුවරු සහ තොරතුරු පුවරු සියල්ලෙහි දෙමළ භාෂාව ඇතුළත් කර භාෂාත්‍රයෙන් සකස් කරන ලෙසත් මහජන බැංකුවෙහි ප්‍රධාන කළමනාකරු වෙත නිර්දේශ කිරීම
මීගමුව මහනගර සභා ගොඩනැගිල්ල තුළ සහ මහනගර සභා බල ප්‍රදේශය තුළ මාර්ගවල ප්‍රදර්ශනය කර ඇති නාමපුවරුවල දෙමළ භාෂා අක්ෂර දෝෂ සහිත බව	අදාළ නාමපුවරුවල දෙමළ භාෂා අක්ෂර දෝෂ නිවැරදි කරන ලෙස මීගමුව මහනගර සභාවේ නාගරික කොමසාරිස් වෙත නිර්දේශ කිරීම.
මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පාර්ලිමේන්තුව ඉදිරිපිට ප්‍රදර්ශනය කර ඇති පුවරුවෙහි දෙමළ භාෂා අක්ෂර දෝෂ සහිතව සකසා ඇති බව	අදාළ නාමපුවරුවේ දෙමළ භාෂා අක්ෂර දෝෂ නිවැරදි කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති වෙත නිර්දේශ කිරීම.
බුස්ස බන්ධනාගාරයට අයත් ශ්‍රී ලංකා බුස්ස සිර මැදිරිය යන්න සඳහන් කර ඇති ප්‍රධාන නාම පුවරුවෙහි ‘ශ්‍රී ලංකා’ යන්න දෙමළ භාෂාවෙන් දැක්වීමේ දී ‘ඉලංගෙයි’ ලෙස නිවැරදි විය යුතු	අදාළ ප්‍රධාන නාමපුවරුවේ දෙමළ භාෂාව නිවැරදිව ඇතුළත් කර සකස් කරන ලෙස බුස්ස බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරි වෙත නිර්දේශ කිරීම.
මන්නාරම දිසා අධිකරණයේ නාම පුවරුවේ ප්‍රාදේශිය භාෂාව වශයෙන් මුලිකව දෙමළ භාෂාව යෙදිය යුතු බව	අදාළ නාමපුවරුව නිවැරදි භාෂා අනුපිළිවෙලට සකස් කරන ලෙස මන්නාරම දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත නිර්දේශ කිරීම.
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අයත් චිත්‍රධාරී දෙපාර්තමේන්තුවේ ඇතුළත පිහිටා ඇති දොරටුව අසළ නාම පුවරුවේ “තිනෙක්කලම්” යන්නෙහි දෙමළ භාෂා අක්ෂර දෝෂ සහිත බව	අදාළ නාමපුවරුවෙහි දෙමළ භාෂා අක්ෂර දෝෂ නිවැරදි කරන ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත නිර්දේශ කිරීම.

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සකස් කර මහජනතාව වෙත ලබා දී ඇති කොවිඩ් 19 වසංගතය ව්‍යාප්තිය පුද්ගල තොරතුරු ලබාගැනීමේ ආකෘති පත්‍රය ඉංග්‍රීසි සහ චීන භාෂාවෙන් පමණක් මුද්‍රණය කර ඇති බව	අදාළ අයදුම්පත්‍රය සිංහල සහ දෙමළ භාෂාවන්ද ඇතුළත් කර භාෂාත්‍රයෙන් මුද්‍රණය කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (නිරෝධානය) වෙත නිර්දේශ කිරීම.
කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 695-අඹකොටේ වසමෙහි ග්‍රාම නිලධාරි එන්. විග්නේෂ්වරන් මහතා 2020.11.02 දින ගම වසම තුළ ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධන ආකෘති පත් බෙදා දෙමින් සිටින විට, මාළු ව්‍යාපාරිකයෙකු විසින් ඔහු වෙත පිහිය දමා ගසමින් රාජකාරිය කටයුතු සඳහා බාධා සිදුකර බව සඳහන් කරමින් තෙල්දෙණිය පොලිසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. නමුත් පැමිණිල්ල සිංහල භාෂාවෙන් සටහන් කර ගැනීම හේතුවෙන් යම් අඩුපාඩුවක් සිදුවි ඇති බව	අදාළ පැමිණිල්ල ඔහුගේ භාෂාවෙන් ලබාගැනීමට කටයුතු කරන ලෙස තෙල්දෙණිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත නිර්දේශ කිරීම.



රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන

2020

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
9 වන මහල, ජනජයසිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

2020 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය (ප්‍රකාශය)

වත්කම්	සටහන	2020	2019
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛන	**1**	**292,900.00**	387,400.00
පෙර ගෙවීම්	**2**	-	-
සේවකයින්ට ලබාදෙන ණය	**3**	3,350,470.48	3,384,576,15
ඉන්වෙන්ට්‍රි භාණ්ඩ		-	79,674.35
ලිපි ද්‍රව්‍ය (තොග)		818,090.90	971,379.21
උප අග්‍රිම පියවීම		193,530.75	179,030.75
මුදල් සහ මුදල් සමාන දෑ		1,805,438.02	670,988.13
විශේෂ අත්තිකාරම්		2,000.00	5,200.00
උත්සව අත්තිකාරම්		7,400.00	17,400.00
අනිකුත් වත්කම්		-	614,800.00
		6,469,830.15	6,310,448.59
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	4	**5,415,802.01**	**8,292,032.65**
මුළු වත්කම්		**11,885,632.16**	**14,602,481.24**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු	5	305,561.84	1,630,988.85
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		313,214.00	308,854.00
		618,775.84	**1,939,842.85**
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**6**	**3,562,360.27**	**3,122,744.90**
මුළු බැරකම්			
ශුද්ධ වත්කම්		**7,704,496.05**	**9,539,893.49**
ශුද්ධ වත්කම්/සම කොටස්			
සමුච්චිත අතිරික්තය/හිඟය	**7**	**7,704,496.05**	**9,539,893.49**

මෙයට අමුණා ඇති සටහන මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසකි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති සහ රජයේ මූල්‍ය රෙගුලාසි චක්‍රලේඛවලට අනුකූලව ය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ. අධ්‍යක්ෂක මණ්ඩලය උදෙසා සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....	.....	.....
(සභාපති)	**(කොමිෂන් සභා සාමාජික)**	**ඩී.එම්.ඒ.එන්. දිසානායක**
		(ගණකාධිකාරී - වැඩබලන)

	සටහන	2019	2018
ආදයම්			
භාණ්ඩාගාරයෙන් ලැබුනු පුනරාවර්තන ප්‍රදානයන්		21,718,000.0	25,620,000.00
ආදායම්		112,553.99	265,553.08
වෙනත් ආදායම්	8	111,390.77	155,493.85
මුළු ආදායම්		**21,941,944.76**	**26,041,046.93**
වියදම්			
වැටුප්, වේතන සහ සේවකයින් සඳහා ප්‍රතිලාභ	9	15,616,236.27	14,334,727.33
සැපයුම් සහ පරිභෝජ්‍ය පාවිච්චි කිරීම්	10	1,838,679.25	1,475,666.54
ක්ෂය කිරීම්		3,002,980.64	3,034,793.38
අළුත්වැඩියා සහ නඩත්තු කිරීම්	11	566,452.47	970,935.59
උපයෝග සහ අනිකුත් සේවාවන්	12	1,159,128.69	1,317,861.38
අනිකුත් වියදම්	13	133,800.00	3,063,677.70
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන්	13	1,210,064.88	5,748,088.54
විගණන ගාස්තු	14	250,000.00	250,000.00
මුළු වියදම්		**23,777,342.20**	**30,195,750.46**
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය)		**(1,835,397.44)**	**(4,154,703.53)**

මෙයට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසකි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	භාණ්ඩාගාරයන් ලැබුණු ප්‍රතිපාදන	උපචිත අරමුදල්	වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	වෙනත්	එකතුව
2019.01.01 දිනට ආරම්භක ශේෂය		11,590,615.69			11,590,615.69
භාණ්ඩාගාරයෙන් ලැබූණු ප්‍රාග්ධන ප්‍රතිපාදන	1,175,000.00				1,175,000.00
2019 වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)			(4,154,703.53)		(4,154,703.53)
මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම්				1,000,000.00	1,000,000.00
ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථය සඳහා ක්ෂය කිරීම				(166,666.67)	(166,666.67)
ආපදා ණය ශේෂය ගැළපීම				95,648.00	95,648.00
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,175,000.00**	**11,590,615.69**	**(4,154,703.53)**	**928,981.33**	**9,539,893.49**
2020 ජනවාරි 01 දිනට ශේෂය		9,539,893.49			9,539,893.49
භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රතිපාදන	-				-
2020 වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය)			(1,835,397.44)		(1,835,397.44)
2020 දසැම්බර් 31 දිනට ශේෂය	**0.00**	**9,539,893.49**	**(1,835,397.44)**	**-**	**7,704,496.44**

මෙයට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසකි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ගැලීම් ප්‍රකාශය

	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ගලනය		
අතිරික්තය/(හිඟය)	(1,835,397.44)	(4,154,703.53)
ජංගම නොවන සංචලන		
වාහන අපහරණය කිරීමෙන් ලද ලාභය	-	(255,000.00)
පාරිතෝෂික	439,615.37	74,476.50
ක්ෂය කිරීම්	3,002,980.64	3,034,793.38
පෙර වර්ෂයේ ගැලපීම්		
ආපදා ණය ශේෂය ගැලපීම	-	95,648.00
ජංගම නොවන සංචලනවලට පසුව මුදල් ගැලීම	1,607,198.57	(1,204,785.65)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
පෙර ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම	-	-
භාණ්ඩ ලේඛනවල (වැඩිවීම)/අඩුවීම	94,500.00	181,620.00
සේවකයින්ට ලබාදුන ණයවල (වැඩිවීම)/අඩුවීම	34,105.67	(459,864.07)
ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල (වැඩිවීම)/අඩුවීම	79,674.35	-
ලිපිද්‍රව්‍යවල (තොග) (වැඩිවීම)/අඩුවීම	153,288.31	580,278.25
අනිකුත් වත්කම්වල (වැඩිවීම)/අඩුවීම	614,800.00	(240,400.00)
උප අග්‍රිමවල (වැඩිවීම)/අඩුවීම	-	-
විශේෂ අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	3,200.00	(4,800.00)
නොපියවන ලද අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	-	-
උත්සව අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	10,000.00	(7,500.00)
ගෙවිය යුතු - (වැඩිවීම)/අඩුවීම	(1,325,427.01))	1,423,610.80
උප අග්‍රිම පියවීම්වල වැඩිවීම/(අඩුවීම)	(14,500.00)	-
ගෙවිය යුතු විගණන ගාස්තුවල (වැඩිවීම)/අඩුවීම	4,360.00	161,240.00
	(345,998.68)	151,148.48
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**1,261,199.89**	**(1,053,637.17)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
දේපළ යන්ත්‍ර සහ පිරියත මිලදී ගැනීම්	**(126,750.00)**	**(2,011,825.00)**
මෝටර් රථ අපහරණය කිරීම	-	942,500.00
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	(126,750.00)	(1,069,325.00)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදානයන්	-	**1,175,000.00**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම		1,175,000.00
මුදල් සහ සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**1,134,449.89**	**(947,962.17)**
වර්ෂය ආරම්භයේදී මුදල් සහ සමාන අගයන්	**670,988.13**	**1,618,950.30**
වර්ෂය අවසානයේදී මුදල් සහ සමාන අගයන්	**1,805,438.02**	**670,988.13**

1. වාර්තා කරන ආයතනය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් සංස්ථාපනය කරන ලද පූර්ණ ලෙස රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනයක් වන අතර, එය රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත පාලන අමාත්‍යාංශ විෂයපථයට අයත් වේ. කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය 9 වන මහල, "ජනජයසිරි" ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

1.1 ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමයි.

1.2 සේවක සංඛ්‍යාව

2020 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව 20 ක්වූ අතර, 2020 වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 42 කි.

1.3 මූල්‍ය ප්‍රකාශනවල වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය කාර්යසාධනයේ ප්‍රකාශනය, මුදල් ගැලීමේ ප්‍රකාශනය, සමකොටස්වල (Equity) වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යන කරුණු අඩංගු වේ. මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය, මුදල් සහ ක්‍රම සම්පාදන අමත්‍යාංශය සහ විගණකාධිපති දෙපාර්මේන්තුව එක්ව නියම කොට ඇති පරිදි සහ මුදල් රගුලාසි සහ අදාළ රජයේ චක්‍රලේඛවල දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙළ කොට ඇත.

2.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන; 1983 අංක 12 දරන පාරිතෝෂික පනත පාදක කරගත් සේවක විශ්‍රාම පාරිතෝෂික හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කොට ඇත. මූල්‍ය ප්‍රකාශනවලට උද්ධමනීය සාධක සඳහා ගැළපීම් කොට නැත.

2.3 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

ඇස්තමේන්තුවල සැලකිය යුතු ප්‍රමාණයක තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනෙන ගණන් මත අවිනිශ්චිත ලෙස වඩාත් සැලකිය යුතු බලපෑම් වන්නේ පහත කරුණු ය.

සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන (සටහන 9)
වත්කම් අපහායනය කිරීම (සටහන 3.1)

2.4 ද්‍රව්‍යාත්මක බව සහ ඒකරාශි කිරීම

එක් එක් වර්ගවලට අයත් සමරූපී අයිතමයන් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අසමරූපී වර්ගවල හෝ කාර්යයන්හි අයිතමයන් අද්‍රව්‍ය මිසක වෙන්කර ගෙනහැර දක්වා ඇත.

2.5 සංසන්දනාත්මක තොරතුරු

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීමට සෑම ස්ථානයකදීම අනුකූලතාවයක් දක්වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වර්ග කර ඇත.

3 සුවිශේෂී ගිණුම් පිළිවෙත්

පසුගිය වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම් පිළවෙත් වෙනස් නොවන අතර, ඒවා ස්ථීරවම ආයතනය විසින් අදාළ කරගෙන ඇත.

3.1 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම
දේපළ, පිරියත සහ උපකරණ

හඳුනාගැනීම සහ තක්සේරු කිරීම

දේපළ, පිරියත සහ උපකරණ ඒවා ගනු ලැබූ මිල හෝ ඒ මත වූ යම් වෙනත් ආනුෂංගික වියදම් මත සටහන් කොට ඇත. මෙම වත්කම් පහතින් දක්වා ඇති පදනම මත සපයනු ලබන අඩු සමුච්චිත ක්ෂයවීමේ වියදමෙහි දක්වා ඇත.

දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය, වත්කම් ලබාගැනීමට සෘජුවම අය කළ හැකි වියදමට ඇතුළත් කොට ඇත. මහා භාණ්ඩාගාරයෙන් හෝ වෙනත් රාජ්‍ය අයතනයකින් වත්කම් මාරු කරනු ලබන අවස්ථාවේදී එම වත්කම් ලබාගැනීමට එකී ආයතනයට වැය වූ වියදම හෝ ප්‍රත්‍යාගණනය කරනු ලබන මුදල මත එම වත්කම් පාවිච්චි කරන්නේ නම් එවිට එය වත්කම් පිරිවැය ලෙස සටහන් කරනු ලැබේ.

සම්පූර්ණයෙන් ක්ෂයවුණු සහ භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින වත්කම් පැවතියද එහෙත් ඒවා කොමිෂන් සභාව විසින් භාවිතා කරමින් තිබෙන්නේ නම් ඒවායේ උපයෝගී ආයු කාලය තක්සේරු කළ නොහැකි බැවින් ඒවා ප්‍රත්‍යාගණනය කිරීම හෝ අපචය කිරීම සිදුකරයි. කෙසේ වෙතත් මෙවැනි ආකාරයේ වත්කම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහනෙහි අනාවරණය කරනු ඇත.

3.2 ඇස්තමේන්තු භාවිතය සහ තීරණ

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඇස්තමේන්තු සෑදීම, තීරණ ගැනීම සහ උපකල්පනය කිරීම, ගිණුම් පිළිවෙත් අදාළ කරගැනීමේදී ඇතිවන බලපෑම, වාර්තාගත වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ආදිය පිළිබඳව කළමනාකරණය විසින් සැලකිල්ලට ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු සහ උපකල්පනය කිරීම්, තත්ත්ව යටතේ එකඟ විය හැකි යැයි විශ්වාස කෙරෙන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තුගත මුදලින් වෙනස් විය හැකි ය.

ක්ෂය කිරීම

සම්පූර්ණ වර්ෂයේ ක්ෂය කිරීම සපයනු ලබන්නේ එකී අයිතම මිලදී ගනු ලැබූ වර්ෂයේ වන අතර, 2008 වර්ෂයට පෙර මිලදී ගනු ලැබූ අයිතම සඳහා වර්ෂය තුළ කරනු ලැබූ අපහරණය කිරීම්වලට ක්ෂය කිරීම් සපයා නැත. ක්ෂය කිරීම් ගණනය කරනු ලබන්නේ 2008 වර්ෂයෙන් පසුව මිලදී ගනු ලැබූ වත්කම් සඳහා අයිතමය මිලදී ගනු ලැබූ දිනය / අයිතමය අපහරණය කරනු ලැබූ මාසය මත ය.

මේ වර්ෂයට සහ සංසන්දනාත්මක වර්ෂය සඳහා සළුල ආයු කාලය පහත පරිදි වේ.

පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 5 යි
කාර්යාලීය උපකරණ	අවුරුදු 10 යි
මෝටර් රථ	අවුරුදු 4 යි
පරිගණක	අවුරුදු 4 යි
වායුසමීකරණ යන්ත්‍ර	අවුරුදු 5 යි

3.3 භාණ්ඩ ලේඛන

භාණ්ඩ ලේඛන දක්වනු ලබන්නේ පහළ පිරිවැයකින් සහ ශුද්ධ උපලබ්ධි අගයකිනි. ශුද්ධ උපලබ්ධි අගය යනු පවාරණ සහ විකුණුම් වියදම්වල ඇස්තමේන්තුගත පිරිවැයෙන් ඇස්තමේන්තුගත විකිණුම් මිල අඩුකළ පසු ලැබෙන අගයයි. භාණ්ඩ ලේඛනය, කොමිෂන් සභාවේ ප්‍රකාශනවලට අයත් වේ. මෙම ප්‍රකාශනවල උපලබ්ධි අගය යනු මිල ස්ථාවර වනවිට විකුණුම් මිල ය. මේ සම්බන්ධයෙන් දැරීමට විකුණුම් පිරිවැය අනුමත කරනු නොලැබේ.

3.4 කලින් ගෙවීම් සහ කළ යුතු ගෙවීම්

කලින් ගෙවීම් සහ කළ යුතු ගෙවීම්, දරනු ලබන තථ්‍ය පිරිවැයෙහි සහ කොන්ත්‍රාත්තුව යටතේ දැරිය යුතු පිරිවැයෙහි දක්වා ඇත.

3.5 සේවකයින්ට ලබාදෙන ණය

සේවකයින්ට ලබාදෙන ණය පිළිබඳ විස්තර පිරිවැයෙහි සඳහන් කොට ඇත. නුසුදුසු හෝ ආපසු ලබාගත නොහැකි ණය වෙනුවෙන් අනුමැතිය ලබාදී නොමැති හෙයින් එවැනි ණය සඳහා ප්‍රතිපාදන සාදා නොමැත. නුසුසුදු හෝ ආපසු ලබාගත නොහැකි ණය පිළිබඳ විස්තර අනාවරණය කිරීම ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් කොට ඇත.

3.6 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව ය. දැනට සිටින ස්ථීර සේවකයින් සඳහා වර්ෂයට අදාළ පාරිතෝෂික ලෙස තමාට හිමි අවසන් මාසයේ මූලික වැටුපෙන් අඩක් වන සේ ගණනය කොට ලබාදෙනු ඇත.

3.7 ආදායම්

පුනරාවර්තන වියදම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කරනු ලබන අක්මුදල් අග්‍රිමය ආදායමක් ලෙස හඳුනාගැනේ. ප්‍රාග්ධන වියදම් සඳහා අක්මුදල් අග්‍රිමය හෝ ප්‍රාග්ධන වියදම්හි සෘජු මාරුකිරීම් හෝ ප්‍රාග්ධන වත්කම් හි සෘජු මාරුකිරීම් කොමිෂන් සභාවේ සමුච්චිත සෘජු ප්‍රාග්ධනායනය ලෙස හඳුනාගැනේ.

3.8 වියදම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගනු ලබන්නේ දැරීමට සිදුවන පිරිවැයෙහි සෘජු සම්බන්ධය සහ ආදායමෙහි විශේෂිත වූ අයිතමයෙහි ඉපයීම් පදනම් කරගෙන ය. කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් වෙනුවන් දරනු ලබන සියලුම වියදම් එනම් දේපළ යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීමේදී දැරීමට සිදුවන වියදම් සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යන වියදම් ආදී සියලුම වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කොට ඇත.

3.9 මුදල් ගැලීමේ ප්‍රකාශනය

මුදල් ගැලීමේ ප්‍රකාශනය පිළියෙළ කොට ඇත්තේ සෘජු නොවන ක්‍රමය භාවිතා කරමිනි.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. භාණ්ඩ ලේඛන

ප්‍රකාශන

ප්‍රකාශනයෙහි නම	2020 රු.	2019 රු.
ඉංග්‍රීසි සිංහල පදමාලා	53,050.00	53,050.00
දෙමළ ඉංග්‍රීසි පදමාලා	24,390.00	24,390.00
දෙමළ විශේෂ පදමාලා	180.00	180.00
පැය 40 හි කෙටිකාලීන පාඨමාලා පොත	215,280.00	309,780.00
එකතුව	**292,900.00**	**387,400.00**

2. කලින් සිදුකරන ලද ගෙවීම්

2020	2019
-	-
-	-

3. සේවකයින්ට ලබාදෙන ණය සහ අත්තිකාරම්

වර්ගය	2020.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රාග්ධන අයකරගැනීම්	2020.12.31 දිනට ශේෂය
උත්සව අත්තිකාරම්	17,400.00	-	10,000.00	7,400.00
ආපදා ණය	3,384,576.15	354,864.33	388,970.00	3,350,470.48
විශේෂ අත්තිකාරම්	5,200.00	36,000.00	39,200.00	2,000.00
	3,407,176.15	**390,864.33**	**438,170.00**	**3,359,870.48**

4. දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම

වර්ගය	2020.01.01 දිනට ශේෂය	එකතු කිරීම් / ප්‍රත්‍යාගණනය කිරීම්	අපහරණය කිරීම්	2020.12.31 දිනට ශේෂය
වායුසමීකරණ යන්ත්‍ර	275,814.54	-	-	275,814.54
පරිගණක	3,671,866.00	-	-	3,671,866.00
මෝටර් රථ	6,365,000.00	-	-	6,365,000.00
පිරියත සහ යන්ත්‍රෝපකරණ	347,309.75	-	-	347,309.75
කාර්යාලීය ගෘහ භාණ්ඩ	7,168,632.68	-	-	7,168,632.68
කාර්යාලීය උපකරණ	634,975.00	126,750.00	-	7,168,632.68
මුළු පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම	**18,463,597.97**	**126,750.00**	**-**	**18,590,347.97**
සමුච්චිත ක්ෂය කිරීම්				
පරිගණක	1,767,698.33	699,513.09	-	2,467,211.42
මෝටර් රථ	4,776,750.00	1,591,250.00	-	6,365,000.00
පිරියත සහ යන්ත්‍රෝපකරණ	347,309.75	-	-	347,309.75
වායුසමීකරණ යන්ත්‍ර	212,143.92	43,670.62	-	275,814.54
කාර්යාලීය ගෘහ භාණ්ඩ	3,036,844.15	603,285.68	-	3,640,129.83
කාර්යාලීය උපකරණ	13,819.17	65,261.25	-	79,080.96
මුළු සමුච්චිත ක්ෂය කිරීම්	**10,171,565.32**	**3,002,980.64**	**-**	**13,174,545.96**
ශුද්ධ පොත් අගය	**8,292,032.65**			**5,415,802.01**

අනාවරණය කිරීම්

1. **පිරියත සහ යන්ත්‍රෝපකරණවල වටිනාකම 2016 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නිසා එය 2020 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කළ යුතු ය.**

2. **රු. 1,135,775.88 ක් වන කාර්යාලීය ගෘහභාණ්ඩවල වටිනාකම, රු. 1,528,016.00 සහ රු. 275,814.54 ක් වන වායුසමීකරණ යන්ත්‍රවල වටිනාකම 2020 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නිසා ඒවා 2021 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කළ යුතු ය.**

3. **රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සතුව විධිමත් ක්‍රමයක් නොමැති අතර, එය සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් හඳුනාගනු ලබන අවස්ථාවේදී සිදුවන අපහසුතා නිසා ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය ප්‍රමාදවීමට හේතු විය. කෙසේ වෙතත් මේ වනවිට වත්කම් සංකේත කිරීමේ ක්‍රමයක් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් සිදුකරමින් පවතින අතර එම ක්‍රියාවලිය සම්පූර්ණ කළ පසු සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කරනු ඇත.**

5. ගෙවිය යුතු

		2020	2019
		රු.	රු.
2841	- ලිපිද්‍රව්‍ය	24,160.00	18,078.62
2811	- වැටුප්	6,500.00	6,500.00
2883	- දුරකථන බිල්පත්	34,055.40	40,629.15
2886	- පවිත්‍රතා සේවා	39,261.90	52,291.32
2862	- කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම්	-	20,782.11
2464	- පරිගණක නඩත්තු කිරීම්	10,000.00	7,457.00
2849	- වෙනත්	22,000.00	54,143.00
2815	- අතිකාල ගෙවීම්	64,496.54	32,311.12
තැන්පත් ගෙවිය යුතු (2540)		3,250.00	3,250.00
2831	- ගමන් වියදම්	2,100.00	350.00
3042	- මුද්‍රණ	99,738.00	1,395,196.53
		305,561.84	**1,630,988.85**

6. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

	2020	2019
	රු.	රු.
ඉදිරියට ගෙනා ශේෂය	3,122,744.90	3,048,268.40
වර්ෂය තුළ එකතු කිරීම්	439,615.37	443,262.00
වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම්	-	368,785.50
	3,562,360.27	**3,122,744.90**

7. සමුච්චිත අරමුදල්

	2020	2019
	රු.	රු.
කලින් වර්ෂයේ ගැළපීම්වලට පෙර ඉදිරියට ගෙනා ශේෂය	9,539,893.49	11,590,615.69
(+)		
ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්	-	1,175,000.00
අතිරික්තයට/(ඌනතාවයට) පෙර සමුච්චිත අරමුදල	9,539,893.49	12,765,615.69
වර්ෂය සඳහා අතිරික්තය/(ඌණතාවය)	(1,835,397.44)	(4,154,703.53)
කලින් වර්ෂයේ ගැළපීම්	-	833,333.33
ආපදා ණය ශේෂය ගැළපීම	-	95,648.00
	3,562,360.27	**3,122,744.90**

8. අනිකුත් ආදායම්

	2020	2019
	රු.	රු.
සේවක ණය පොලී	111,390.77	132,173.85
විවිධ ආදායම්	-	23,320.00
	3,562,360.27	**3,122,744.90**

9. වැටුප්, වේතන සහ සේවකයින් සඳහා ප්‍රතිලාභ

	2020	2019
	රු.	රු.
වැටුප් සහ වේතන	10,705,229.36	9,391,282.19
සේවක අර්ථසාධක අරමුලේ දායකත්වය	1,456,094.71	1,248,688.00
සේවා නියුක්තයින්ගේ භාර අරමුලේ	364,023.68	312,172.00
අතිකාල	358,773.15	755,057.71
වැටුප් දීමනා	2,292,500.00	2,184,265.43
පාරිතෝෂික දීමනා	439,615.37	443,262.00
	15,616,236.27	**14,334,727.33**

10. සැපයුම් සහ පරිභෝජ්‍ය භාණ්ඩ

	2020	2019
	රු.	රු.
ලිපිද්‍රව්‍ය	536,033.30	574,458.54
නිල අඳුම්	20,000.00	38,240.00
පුවත්පත් සහ වාර සඟරා	1,470.00	79,240.00
ඉන්ධන සහ ලිහිසි තෙල්	296,774.60	494,840.00
සැපයුම් - පරිභෝජ්‍ය	734,724.35	-
වෙනත් - 2849	249,697.00	288,198.00
	1,838,679.25	**1,475,666.54**

11. සැපයුම් සහ පරිභෝජ්‍ය භාණ්ඩ

	2020	2019
	රු.	රු.
කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම්	47,607.75	177,960.00
පරිගණක නඩත්තු කිරීම්	108,933.50	62,926.35
මෝටර් රථ නඩත්තු කිරීම්	209,774.40	118,668.32
වායුසමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම්	-	31,500.00
ගොඩනැගිලි නඩත්තු කිරීම්	-	365,000.00
රක්ෂණ සහ බලපත්	200,136.82	214,880.00
	566,452.47	**970,935.59**

12. උපයෝග සහ අනිකුත් සේවාවන්

	2020	2019
	රු.	රු.
දූරකථන සහ අන්තර්ජාල	426,077.38	522,399.09
පවිත්‍රතා සේවාවන්	658,051.31	695,462.29
තැපැල් ගාස්තු	75,000.00	100,000.00
	1,159,128.69	**1,317,861.38**

13. උපයෝග සහ අනිකුත් සේවාවන්

	2020	2019
	රු.	රු.
බඳවා ගැනීම් සහ විභාග	-	1,748,684.50
පරිත්‍යාග කරන ලද පොත් සඳහා වියදම	94,500.00	181,620.00
ගමන් ගාස්තු - දේශීය	39,300.00	226,739.00
ගමන් ගාස්තු - විදේශීය	-	906,634.20
	133,800.00	**3,063,677.70**

1.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

	2020	2019
	රු.	රු.
පුහුණු කිරීම්	18,000.00	918,820.00
වැඩමුළු සහ සම්මන්ත්‍රණ	598,090.00	2,705,572.51
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම්	118,265.00	377,281.00
වෙනත් - 3070	94,456.88	273,593.50
දැන්වීම්	278,515.00	77,62.00
මුද්‍රණ	99,738.00	77,625.00
ක්ෂේත්‍ර ගමන් බිමන්	3,000.00	-
	1,210,064.88	**5,748,088.54**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ අනෙකුත් ලේඛන

ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රදානයන්

2020.01.01 දිනට ශේෂය	(77,662.98)
2020 වර්ෂය තුළදී ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රදානයන්	-
2018 වර්ෂයේ ප්‍රාග්ධන වියදම්	**(77,662.98)**
2020.12.31 දිනට ශේෂය	126,750.00
	(204,412.98)

පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රදානයන්

2020.01.01 දිනට ශේෂය	670,988.13
ආරම්භක ශේෂය විය යුතු පුනරාවර්තන ප්‍රදානයන්	748,651.11
2020 වර්ෂය තුළදී පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රදානයන්	21,718,000.00
	22,466,651.11
2020 වර්ෂය තුළ පුනරාවර්තන වියදම්	20,510,499.12
සේවකයින් සඳහා දෙන ලද ණය සහ අත්තිකාරම්	390,864.33
2020.12.31 දිනට ශේෂය	**1,565,287.66**
අනිකුත් මුදල්මය ලැබීම්	**444,563.34**
2020.12.31 දිනට මුදල් ශේෂය	**1,805,438.02**

2020.12.31 දිනට ණය හිමියන්ගේ ලේඛනය

